නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී

මූලික කාරණා අන්තර්ගත ලේඛනය

- *වෙස්ටර්න් යුනියන්*

වර්ගීකරණය : පොදු

මූලික කාරණා අන්තර්ගත ලේඛනය - නියෝජිත බැංකු සේවය - වෙස්ටර්න් යූනියන් උපනියෝජිත මෙහෙයුම්

නිෂ්පාදනය/ සේවය	යම් දිරිගැන්වීම් සහ ප්‍රවර්ධන ඇතුලු මූල්‍යමය සහ වෙනත් ප්‍රතිලාභ	ගාස්තු/ අයකිරීම් කොමිස් මුදල්, පොළිය	නිෂ්පාදනය/ සේවය ලබා ගැනීම සඳහා අනුගමනය කරනු ලැබිය යුතු කාර්ය පටිපාටිය සහ මූලික අවදානම්	ප්‍රධාන නියම හා කොන්දේසි
වෙස්ටර්න් යූනිටන්	වෙස්ටර්න් යූනියන් ප්‍රේෂණවල අර්ථලාභීන් සඳහා ඕනෑම NDB උපනියෝජිත ස්ථානයකින් ස්වකීය ප්‍රේෂණ රැස්කර ගැනීම සඳහා ඉඩදෙනු ලැබේ.	NDB උපනියෝජිත ස්ථානවලදී ස්වකීය වෙස්ටර්න් යූනියන් ප්‍රේෂණ රැස්කර ගැනීමේ දී අර්ථලාභීන් විසින් කිසිදු කොමිස් මුදලක් හෝ ගාස්තුවක් ගෙවීමට නියමත නොවේ.	1. ප්‍රේෂණකරු විසින් සන්නිවේදනය කරනු ලබන වලංගු MTCN අංකයක් (මුදල් හුවමාරු කිරීම පාලනය කිරීමේ අංකය) ගනුදෙනුකරු විසින් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. 2. ගනුදෙනුකරු විසින් වලංගු හඳුනාගැනීමේ ලේඛනයක් රැගෙන යා යුතු ය. (ජාතික හැඳුනුම්පත/ රියදුරු බලපත්‍රය/ විදේශ ගමන් බලපත්‍රය) 3. අර්ථලාභියා ශ්‍රී ලාංකිකයකු නොවේනම්, වලංගු වීසා බලපත්‍රයක් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. 4. ගනුදෙනුකරු විසින් මුදල් ලබාගැනීමේ ආකෘතිපත්‍ර සම්පූර්ණ කරනු ලැබිය යුතු ය. (උපනියෝජිත විසින් ඉල්ලා සිටිනම් පමණක්) 5. ගනුදෙනුව වලංගු වේ නම් සහ ගනුදෙනුකරු විසින් සපයා ඇති තොරතුරු වෙස්ටර්න් යූනියන් පද්ධතියේ සඳහන්වන තොරතුරු සමග සැසඳේනම්, ගනුදෙනුකරුට ප්‍රේෂණ රැස්කර ගැනීමට හැකියාව ලැබේ. 6. ප්‍රේෂණ පද්ධතිය හරහා උත්පාදනය වන ගෙවීම් රිසිට්පතක් (මුදල් ලබා ගැනීමේ ආකෘතිපත්‍රයක්) NDB වෙස්ටර්න්	1. මෙම සේවාව තනි පුද්ගලයන් සඳහා පමණක් පිරිනමනු ලැබේ. 2. NDB උපනියෝජිතගේ පරම අභිමතය පරිදි මෙම පහසුකම පිරිනමනු ලැබේ. 3. වෙස්ටර්න් යූනියන් විසින් නිශ්චිතව දක්වනු ලබන සියලු නියම හා කොන්දේසිවලට වෙස්ටර්න් යූනියන් ප්‍රේෂණ යටත් වේ. 4. අර්ථලාභියා විසින් වලංගු අනන්‍යතා ලේඛනයක් හෝ වලංගු වීසා බලපත්‍රයක් ඉදිරිපත් කිරීමට අපොහොසත්වේ නම්, ප්‍රේෂණ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය උප නියෝජිත සතුවේ. 5. සැකකටයුතු ස්වභාවයේ යම් ගනුදෙනුවක් NDB උප නියෝජිත විසින් ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි ය.

වර්ගීකරණය : පොදු

			යූනියන් උප නියෝජිත විසින් ඉදිරිපත් කරනු ලබන අතර එම රිසිට්පත මුදල්ද සමග ගනුදෙනුකරුට භාරදිය යුතුවේ. **මූලික අවදානම්** 1. අනන්‍යතාවය සොරකම් කිරීම හෝ වෙනත් කුඨ උපක්‍රම වැනි වංචාසහගත ගනුදෙනු 2. ගෙවීම් සැකසෙමින් පැවතියදී සිදුවන මෙහෙයුම් දෝෂ 3. දැනට පවත්නා AML ප්‍රතිපත්ති සමග පවතින නියාමන අනුකූලතා 4. තාක්ෂණික ගැටලු හේතුවෙන් සිදුවන සේවා බිඳ වැටීම 5. ගනුදෙනුකරුවන්ගේ ආරවුල්	6. කොටස් ගෙවීම සඳහා ඉඩදෙනු නොලබන බැවින්, උපනියෝජිතගේ ස්ථානයේ මුදල් නොමැතිවීම හේතුවෙන් ගනුදෙනුකරු විසින් ගෙවීම් කරන ලෙස ඉදිරිපත් කරන ලද යම් ඉල්ලීමක් NDB උප නියෝජිත විසින් ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි ය. 7. පැය 24 පුරා ක්‍රියාත්මක වන NDB බැංකුවේ අංක. +941124488888 දරන අංකය ඔස්සේ NDB ඇමතුම් මධ්‍යස්ථානය වෙත ආරවුල් වාර්තා කරනු ලැබිය යුතු ය.

ඔබගේ පසුවිපරම අපසමග හුවමාරු කරගන්න

සියලු අවස්ථාවලදී ඔබ සෑහීමට පත්වන ආකාරයට ඔබවෙත අපගේ සේවා සැපයීම සඳහා අප ඇපකැපවී සිටින්නෙමු.

අප විසින් ඔබගේ අපේක්ෂාවන් කොතරම් හොඳින් ඉටුකර ඇද්ද යන්න පිළිබඳව දැනගැනීම සඳහා සහ අවශ්‍ය අවස්ථාවලදී දියුණු කරගතයුතු කරුණු පිළිබඳව දැනුවත්වීම සඳහා ඔබගේ පසුවිපරම අප හට උපකාරීවනු ඇත.

ඔබගේ පසුවිපරම හුවමාරු කරගත යුතු ආකාරය:

අංක. 0743648272 ඔස්සේ NDB බැංකුවේ ප්‍රේෂණ ප්‍රධානී හා සම්බන්ධ විය හැකි ය. ishani.lenora@ndbbank.com නැතහොත් (contact@ndbbank.com)

අංක. +94(0) 11 2448888 දරන පැය 24 පුරා ක්‍රියාත්මකවන ඇමතුම් මධ්‍යස්ථාන අංකය අමතන්න.

වර්ගීකරණය : පොදු

ලිඛිතව ඉදිරිපත් කරන්න:- කළමනාකරු, ගනුදෙනුකාර සම්බන්ධතා කළමනාකාර අංශය, නැෂනල් ඩිවලොප්මන්ට් බෑන්ක් පීඑල්සී අංක. 40 නවම් මාවත, කොළඹ 02

අප විසින් ප්‍රතිචාර දක්වන ආකාරය;

පැමිණිල්ල ලැබීමෙන් පසුව, අප විසින් එය බැංකුවේ පැමිණිලි සම්බන්ධයෙන් ක්‍රියාකිරීමේ පද්ධතියෙහි වාර්තාකර එම ගැටලුව වහාම විසඳීම සඳහා උත්සාහ කරන්නෙමු. අපට එසේ ක්‍රියාකිරීමට අපොහොසත් වන අවස්ථාවක දී, අප විසින් ඔබ වෙත වැඩකරන දින තුනක් ඇතුලත විසඳුමක් ලබා දෙන්නෙමු. පැමිණිල්ලේ ස්වභාවය අනුව මෙම කාලසීමාව තුලදී මෙම ගැටලුව විසඳීමට අපට නොහැකි වුවහොත්, අප විසින් ඔබවෙත ප්‍රතිචාර දක්වනු ලබන ඇස්තමේන්තුගත කාලය පිළිබඳව ඔබව දැනුවත් කරන්නෙමු.

ඔබගේ ගැටලුව සම්බන්ධයෙන් වූ අපගේ ප්‍රතිචාරය සමග ඔබ කිසිසේත් සෑහීමට පත් නොවන්නේ නම්, ඔබට ශ්‍රී ලංකාවේ මූල්‍ය ඔම්බූඩ්ස්මන් කාර්යාලය සමග සම්බන්ධවිය හැකි වේ.

ආනන්ද කුමාරදාස මහතා
මූල්‍ය ඔම්බූඩ්ස්මන්
මූල්‍ය ඔම්බූඩ්ස්මන් කාර්යාලය
143A, වජිර පාර,
කොළඹ 05
දුරකථන අංකය: +94 11 259 5624
දුරකථන ෆැක්ස් අංකය: +94 11 259 5625
ඊ මේල්: fosril@sltnet.lk
වෙබ් අඩවිය: www.financialombudsman.lk

වර්ගීකරණය : පොදු